# GMOA

ESTABLISHED IN 1926
TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION

No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk


27/08/2013

## මාධ්‍ය නිවේදනයයි

**නව ජාතික වැටුප් ප්‍රතිපත්තියක් සඳහා වැටුප් කොමිසමක අවශ්‍යතාවය හා වැටුප් පරිමාණය 1:12 කිරීමේ වැදගත්කම.**

සෞඛ්‍ය සේවා වෘත්තිය අරගල ඉතිහාසය විමසා බලන විට වැඩිම වර්ජන ගණනාවක් වාර්තා වී ඇත්තේ 2003 වර්ෂයේය. එක් වෘත්තියකට වඩා තවත් වෘත්තියක් වැඩි වැටුප් ඉල්ලමින් වර්ජන වැලක් ක්‍රියාත්මක විය. මෙම ගැටලුව පිලිබඳව තිරසාර විසඳුමක් ලෙස ජාතික වැටුප් කොමිසමක අවශ්‍යතාවය මුල් වරට යෝජනා කලේ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසිනි. රජය තිස්ස දේවේන්ද්‍ර මහතාගේ සභාපතිත්වයෙන් එම කොමිසම මුල් වරට පත් කලේ 2003 වර්ෂයේදිය. එතැන් පටන් 2006 වර්ෂය වන තෙක් දැඩි ඉවසීමකින් සියලු විෂමතා දරා ගනිමින් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය දිගින් දිගටම ජාතික වැටිප් කොමිසමට අවශ්‍ය සහය ලබා දුන් අතර අනෙක් වෘත්තිය සංගම් වලද එකගතාවය මත 2006/06 චක්‍රලේඛය නිකුත් කරන ලදි. මෙම චක්‍ර ලේඛය ශ්‍රී ලාංකිය රාජ්‍ය සේවයේ සංධිස්ථානයක් සලකුණු කල වැදගත් චක්‍ර ලේඛයක් වන නමුත් එහි බොහෝ අඩුලුහුඩුකම් මේ වන විට හදුනාගෙන තිබේ.

මෙහි ඇති වැදගත්ම සාධනීය ලක්ෂණය වන්නේ සියලුම රාජ්‍ය සේවකයින් තම සුදුසුකම්, කුසලතාවය හා දරණ වගකීම් මත පදනම් වන බැවින්, වර්ජනයන් කරමින් වැටුප් හා වරප්‍රසාද වැඩි කර ගැනීම් සංස්කෘතියට එයින් තිත තැබිණි. මෙම චක්‍ර ලේඛණයේ ඇති ප්‍රධානම ගැටලුව වන්නේ රාජ්‍ය සේවයේ වැටුප් ව්‍යුහයන් අතර අනුපාතය 1:4 වැනි අඩු අගයක් තුල සිරවීමයි. මේ හේතුවෙන් ඉහත කී සේවක කාණ්ඩ අතර වැටුප් තල අතිපිහිත වීමක් සිදුවී ඇත.

මේ පිලිබඳ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය දිගින් දිගටම කරුණු දක්වීමේ ප්‍රතිපලයක් ලෙස 2012 අය වැය වාර්තාවේදි, මෙම කරුණු සලකා බැලීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශ දෙකටම පොදු නව වැටුප් කොමිසමක් පත් කිරීමට රජය යෝජනා කර තිබුණි. එසේ යෝජනා වී මාස 10 ක් ගත වී ඇතත් තවමත් එම වැටුප් කොමිසම ක්‍රියාත්මක වීම තබා පත්වීමවත් සිදුවී නොමැත.

ලොව දියුණු රටවල මෙම අනුපාතය 1:20 පමණ අගයක පවත්වා ගනිමින් රාජ්‍ය සේවය තුල බුද්ධිමතුන් උගතුන් රඳවා ගැනීම සිදුවේ. අසල්වැසි ඉන්දියාවද මෙම අනුපාතය ක්‍රම ක්‍රමයෙන් අද වන විට 1:12 දක්වා වැඩි කරගෙන රට හැර ගිය උගතුන් බුද්ධිමතුන් නැවත තම රට තුලට ආකර්ශණය කර ගනිමින් පවතියි.

ශ්‍රී ලාංකිය රාජ්‍ය සේවය ස්වාවරව හා ගුණාත්මකව පවත්වා ගැනීමට, බුද්ධිමතුන් උගතුන් රාජ්‍ය සේවය තුල රදවා ගැනීමට නම් අවම වශයෙන් ඉන්දියාවේ පවතින වැටුප් අනුපාතයවත් අප පවත්වා ගත යුතුය. මේ හරහා රාජ්‍ය සේවයේ සිදුවන ගුණාත්මක වර්ධනයේ ප්‍රතිඵල මහජනතාවට හිමි වනු ඇත.

එබැවින් වහාම 2013 අයවැයෙන් ප්‍රකාශ කල පරිදි අදාල වැටුප් කොමිසම පත් කර ශ්‍රී ලංකාවේ වැටුප් අනුපාතය 1:12 දක්වා වෙනස් කරන ලෙස අපි රජයට බල කර සිටිමු.

ස්තුතියි

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

වැඩිදුර විස්තර - වෛද්‍ය නලින් ආරියරත්න - 0714800942
වෛද්‍ය නවීන් සොයිසා - 0718582444
වෛද්‍ය නලින්ද හේරත් - 0717876516